# මධ්‍යම පරිසර අධිකාරිය
மத்திய சுற்றாடல் அதிகாரசபை
**Central Environmental Authority**

"පරිසර පියස", 104, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
"பரிசர பியச", 104, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை, இலங்கை.
"Parisara Piyasa", 104, Denzil Kobbekaduwa Mawatha, Battaramulla, Sri Lanka . Web : www.cea.lk


අපේ යොමුව / எமது தொடர்பு / Our Ref. } **CEA/06/EPU/PR/39/2022**
ඔබේ යොමුව / உமது தொடர்பு / Your Ref. }
දිනය / திகதி / Date } **2023.09.20**

## මාධ්‍ය නිවේදනය

**<u>මධ්‍යම පරිසර අධිකාරිය මහනුවර සිදුකළ වැටලීමකින්</u>**

**<u>නීතිවිරෝධී පොලිතීන් "ලන්ච් ෂීට්" කිලෝග්‍රෑම් 400 ක් අත්අඩංගුවට....</u>**

මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රධාන කාර්යාලය සහ මධ්‍යම පළාත් කාර්යාලය විසින් මහනුවර පොලීසිය, මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර පොලිස් ඒකකය සහ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ මහනුවර දිස්ත්‍රික් කාර්යාලය සමඟ ඒකාබද්ධව, මහනුවර නගරයේ සහ පේරාදෙණිය නගරයේ තෝරාගත් ප්‍රදේශයන්හි පසුගියදා (18) සිදුකළ වැටලීමකින් නීතිවිරෝධී පොලිතීන් "ලන්ච් ෂීට්" තොගයක් අත්අඩංගුවට ගන්නා ලදී.

මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර පොලිස් ඒකකයට ලැබුණු තොරතුරක් මත මහනුවර කොළඹ වීදියෙහි පිහිටි වෙළෙඳ සැල් සහ පේරාදෙණිය නගරයේ පිහිටි නීතිවිරෝධී පොලිතීන් ලන්ච් ෂීට් නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් වටලනු ලැබීය. මෙම වැටලීම් වලින් කිලෝග්‍රෑම් 400ක පමණ ප්‍රමාණයක නීතිවිරෝධී "පොලිතීන් ලන්ච් ෂීට්" තොගයක් පාරිභෝගික සේවා අධිකාරිය අත්අඩංගුවට ගෙන ඇත. ජාතික පාරිසරික පනතේ විධිවිධාන යටතේ වෙළෙඳ සැල් හිමියන්ට සහ කර්මාන්ත ශාලාවේ හිමිකරුට එරෙහිව නීතිමය පියවර ගැනීමට මධ්‍යම පරිසර අධිකාරිය කටයුතු කරයි.

නීතිවිරෝධී "පොලිතීන් ලන්ච් ෂීට්", නීතියෙන් තහනම් කර ඇති ග්‍රෑම් 20 හෝ මිලිලීටර් 20ට අඩු සැෂේ පැකට්, හුලං පුරවන ලද සෙල්ලම් බඩු, ප්ලාස්ටික් කූර සහිත කොටන් බඩ්ස් සහ මයික්‍රෝන 20ට අඩු පොලිතීන් නිෂ්පාදන විකිණීම, ප්‍රදර්ශනය, නිෂ්පාදනය සහ භාවිතය ජාතික පාරිසරික පනත යටතේ නීතියෙන් තහනම් කර ඇති අතර මධ්‍යම පරිසර අධිකාරිය මේ සම්බන්ධයෙන් දිවයින පුරා අඛණ්ඩව වැටලීම් සිදුකරයි.

(• අංක 2034/34 දරන 2017 සැප්තැම්බර් මස 01 වන දිනැති ගැසට් පත්‍රය මගින් දේශීය භාවිතය සඳහා පොලිතීන් අමුද්‍රව්‍යයක් වන ආහාර දවටන නිපදවීම, පොලිතීන් අමුද්‍රව්‍යයක් ලෙස යොදා නිෂ්පාදිත ආහාර දවටන රටතුළ විකිණීම, විකිණීම සඳහා අර්පණය, නොමිලයේ ලබා දීම, ප්‍රදර්ශනය හෝ භාවිතය නීතියෙන් තහනම් කර ඇත.
- අංක 2034/33 දරන 2017 සැප්තැම්බර් මස 01 වන දිනැති ගැසට් පත්‍රය මගින් දේශීයව භාවිතය සඳහා ඝනකමින් මයික්‍රෝණ 20 හෝ ඊට අඩු පොලිතීන් හෝ යම් පොලිතීන් නිෂ්පාදන, නිපදවීම, රට තුළ විකිණීම, විකිණීම සඳහා අර්පණය ප්‍රදර්ශනය, නොමිලේ ලබා දීම හෝ භාවිතය නීතියෙන් තහනම් කර ඇත.
- අංක 2211/51 දරන 2021 ජනවාරි මස 21 වන දිනැති ගැසට් පත්‍රය මගින් ශුද්ධ පරිමාව ග්‍රෑම් 20 හෝ මිලිලීටර් 20ට සමාන හෝ අඩු සැෂේ (ආහාර සහ ඖෂධ ඇසුරුම් කිරීමට භාවිත කිරීම හැර), හුළංවලින් පිරවිය හැකි සෙල්ලම් බඩු (බැලුන්, බෝල, දිය මත පාවෙන/පිහිනුම් තටාකවල දී භාවිත කරන සෙල්ලම් බඩු සහ ජල ක්‍රීඩා

උපකරණ හැර); ප්ලාස්ටික් කූර සහිත කොටන් බඩ්ස් (වෛද්‍ය/සායනික ප්‍රතිකාර සඳහා භාවිත කරන ප්ලාස්ටික් කොටන් බඩ්ස් හැර) නිෂ්පාදනය සහ විකිණීම නීතියෙන් තහනම් කර ඇත.

- අංක 2341/30 දරන 2023 ජූලි මස 19 වන දිනැති ගැසට් පත්‍රය මගින් තනි භාවිත ප්ලාස්ටික් බීම බට සහ කලතන; තනි භාවිත ප්ලාස්ටික් පිඟන්, කෝප්ප, හැඳි, ගෑරුප්පු සහ පිහි; ප්ලාස්ටික් මල් මාලා; ප්ලාස්ටික් ඉඳි ආප්ප වට්ටි යන අයිතම 2023 ඔක්තෝම්බර් මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි තහනමට ලක්වේ. මේ අනුව මෙම දිනයෙන් පසු උක්ත අයිතම රට තුළ නිෂ්පාදනය, දේශීය භාවිතය සඳහා ආනයනය, විකිණීම, විකිණීම සඳහා අර්පණය, විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම, නොමිලයේ පිරිනැමීම හෝ ප්‍රදර්ශනය කිරීම තහනම් කර ඇත.)

මාධ්‍ය සම්බන්ධීකරණය - මාධ්‍ය නිලධාරී - ශ්‍රියාන්ජනී ලොකුලියන - 0776252288


සුපුන් එස්. පතිරගේ
සභාපති
මධ්‍යම පරිසර අධිකාරිය